# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,287 - 2022 ජූලි මස 01 වැනි සිකුරාදා - 2022.07.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1114 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1115 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1118 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1120 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 ජූලි මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජූලි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1113 - B 082359- 5,403 (2022/07)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ටෙන්ඩර් දැන්වීම

### මහජන බැංකුව - කුරුණෑගල මලියදේව ශාඛාව

තුල්හිරිය, නාන්ගල්ල, මංගෙදර පිහිටි පාලමගාව අස්වැද්දුම වත්ත නැමැති වටිනා දේපළ මිළදී ගැනීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් කැඳවනු ලැබේ.

ඉඩමේ වපසරිය : පර්චස් 51

01. ඉහත සඳහන් ඉඩම සඳහා ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, කුරුණෑගල මගින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් කැඳවනු ලැබේ.

02. ටෙන්ඩර් පත්‍ර ලේඛනයන් 2022.07.08 වැනි දින දක්වා සතියේ දිනවල පෙ. ව. 9.00 සිට ප. ව. 4.00 දක්වා කුරුණෑගල, වත්හිමි පාරේ පිහිටි කුරුණෑගල, මහජන බැංකුවේ, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමණාකාර මහතාගෙන් ආපසු නොගෙවනු ලබන රු. 3,000ක මුදලක් එකතු කිරීමේ ගිණුම් අංක 226-100192473892 ට තැන්පත් කලාට පසුව ලබාගත හැක.

03. ඉහත සඳහන් මලියදේව ශාඛාවේ, එකතු කිරීමේ ගිණුමට ආපසු ගෙවනු ලබන රු. 50,000/- ක මුදලක් මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක තැන්පත් කර, තැන්පත් කරන ලද තැන්පත් මුදල සඳහා වූ මුල් ලදුපත ටෙන්ඩර් පත්‍රිකාව සමග ඇමිණිය යුතු ය.

04. **2022.07.12** වැනි දින **ප.ව. 2.00**ට ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම අවසන්වන අතර, **2022.07.12** වැනි දින **ප. ව. 3.00** ට කුරුණෑගල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ දී ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ.

05. ටෙන්ඩර් කැඳවීම සම්බන්ධයෙන් අනෙකුත් කොන්දේසි සහ පිළිවෙත් ටෙන්ඩර් පත්‍රිකා සමග නිකුත් කරනු ලැබේ.

06. දේපළ මිළදී ගැනීම සඳහා එකගවන ඉල්ලුම්කරුවන් වැඩි විස්තර කුරුණෑගල, වත්හිමි පාරේ පිහිටි කුරුණෑගල, මහජන බැංකුවේ, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකාර තැනගෙන් ලබාගත හැක.

දුරකතන අංක : 037-2222572, 037-2220670

ප්‍රාදේශීය කළමණාකරු,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය.

මහජන බැංකුව,
වත්හිමි පාර,
කුරුණෑගල.

07-56

## ටෙන්ඩර් දැන්වීම

### මහජන බැංකුව - කැස්බෑව ශාඛාව 327

මාම්පෙ, කැස්බෑව (අංක 9418 දරන පිඹුරෙහි ලොට් අංක A) දරන ස්ථානයේ පිහිටි අගනා දේපලක් මිලදී ගැනීමට මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

ප්‍රමාණය : පර්. 20.0
(ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ)

01. ප්‍රාදේශීය කළමණාකාර (කොළඹ පිටත), මහජන බැංකුව විසින් ඉහත සඳහන් දේපළ සම්බන්ධයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් කැඳවනු ලබයි.

02. 2022.07.27 වැනි දින තෙක්, වැඩකරන දිනයන්හි පෙ. ව. 9.00 සිට ප. ව. 3.30 දක්වා කාලය තුළ ආපසු නොගෙවනු ලබන රු. 3,000/- ක්, රැස් කිරීම් ගිණුම මිශ්‍ර - කැස්බෑව ශාඛාව අංක : 327-1001-72473892 දරන ගිණුමට තැන්පත් කර, කැස්බෑව, හොරණ පාර, අංක 140/2, මහජන බැංකුව කැස්බෑව ශාඛාව, කළමණාකාරිණිය වෙතින් ටෙන්ඩර් අයදුම්පත් ලබා ගත යුතු ය.

03. ආපසු ගෙවනු ලබන රු. 50,000/- ක මුදලක් රැස් කිරීම් ගිණුම මිශ්‍ර - කැස්බෑව ශාඛාව අංක : 327-1001-72473892 දරන ගිණුමට තැන්පත් කොට එම තැන්පතුවේ මුල් පිටපත ටෙන්ඩර් පෝරමය සමග ඇමිණිය යුතු ය.

04. සියලු ටෙන්ඩර් පත් භාර ගැනීම **2022.07.28** වැනි දින **ප. ව. 2.00**ට අවසන් කරන අතර, **2022.07.28** වැනි දින **ප. ව. 3.00**ට කැස්බෑව, හොරණ පාර, අංක 140/2, මහජන බැංකුව කැස්බෑව ශාඛා පරිශ්‍රයේදී සියලුම ටෙන්ඩර්පත් ටෙන්ඩර් කමිටුවක් ඉදිරිපිට විවෘත කරනු ඇත.

05. ටෙන්ඩර් සම්බන්ධයෙන් අදාළ කොන්දේසි හා නියමයන් ටෙන්ඩර් අයදුම්පත් සමග නිකුත් කරනු ලැබේ.

06. මෙම දේපළ පවත්නා තත්ත්වයෙන් විකුණනු ලබන අතර, ගැණුම්කරුවන් එසේ මිලදී ගැනීම සඳහා සූදානම්ව ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතු ය. දේපල සම්බන්ධ වැඩි විස්තර සඳහා කැස්බෑව, හොරණ පාර, අංක 140/2, මහජන බැංකුව, කැස්බෑව ශාඛාවේ, කළමනාකාරිණිය වෙතින් ලබා ගත හැකි වේ.
දුරකතන අංක : 011-2702474/0769919474

ප්‍රාදේශීය කළමණාකාර (කොළඹ පිටත),
මහජන බැංකුව.

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 177/A, හයිලෙවල් පාර,
නුගේගොඩ.

07-57

# බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - අත්තනගල්ල, නිට්ටඹුව**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු අංක සහිත හා නඩු අංක රහිත නඩු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම.

01. අත්තනගල්ල දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ 2022.07.30 පෙ. ව. 10.00ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වෙන දින එය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගෙන් නිසි අවසර ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා ඉල්ලුම්කරු විසින් වෙන්දේසි අවස්ථාවේදීම මුදල් ගෙවිය යුතු අතර, සියලු ගෙවීම් මුදලින් පමණක් ගෙවිය යුතු ය. මේ සඳහා චෙක්පත් භාරගනු නොලබන අතර, මිලදී ගත් භාණ්ඩ එදින ප. ව. 3.00ට පෙර ඉවත් කර ගත යුතු ය.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා ද්‍රව්‍යයන් සඳහා ගැණුම්කරුවන් විසින් තමාගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පිළිගත හැකි හැඳුනුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

06. වෙන්දේසිය අවස්ථාවේ දී අධිකරණය විසින් තබනු ලබන ලන්සුව නොපිළිගන්නා අවස්ථාවේ දී ඉදිරිපත් කළ භාණ්ඩ සම්බන්ධව අවසන් තීරණය ගරු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව දන්වා සිටිමි.

කේසර සී. ඒ. සමරදිවාකර,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
අත්තනගල්ල, නිට්ටඹුව.

2022 ජුනි මස 21 වැනි දින,
අත්තනගල්ල දිසා /මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

2022.07.30 වැනි දින ප්‍රසිද්ධ වෙන්දේසියට නියමිත භාණ්ඩවල ලේඛනය

| අනු. අංකය | වාහන අංකය | වර්ගය |
|---|---|---|
| 01 | MI-0673 | TVS VICTOR |
| 02 | අංක රහිත | BAJAJ PULSAR |
| 03 | HJ-7760 | LONCIN MOTOR CYCLE |
| 04 | WP WQ-4415 | BAJAJ PULSAR 135 LS |
| 05 | GN-3856 | LIFAN GN - 125 |
| 06 | SP UJ-7307 | BAJAJ PULSAR 180 |
| 07 | 154-0158 | HONDA CD 50 |
| 08 | 136-8076 | HONDA CB 125 |
| 09 | 10-5495 | HONDA |
| 10 | අංක රහිත | BAJAJ BOXER |
| 11 | MR-5964 | BAJAJ DISCOVER 125 |
| 12 | NC TS - 1955 | TVS APACHE 150 |
| 13 | 157-0549 | KAWASAKI TRAIL |
| 14 | WP JA-4525 | RANOMOTO CG 125 |
| 15 | NW JT 3149 | BAJAJ CT 100 |
| 16 | අංක රහිත | BAJAJ DISCOVER |
| 17 | WP HI 1958 | LIFAN XL - 125-2 |
| 18 | 93 ශ්‍රී 9934 | HONDA MD 90 |
| 19 | 141-3838 | HONDA MD 90 |
| 20 | 120-5230 | HONDA SUPER CUB 70 |
| 21 | 93 ශ්‍රී 5014 | HONDA MD 90 |
| 22 | 89-9370 | HONDA MD 90 |
| 23 | WP MZ-8809 | HERO HONDA CD-DAWN |
| 24 | WP TZ-9373 | KINETEC KING 100 DLX |
| 25 | 103-6889 | HONDA MD 90 |
| 26 | HI-8914 | HONDA CB -125 T |
| 27 | WP WO-8684 | BAJAJ PULSAR 135 LS |
| 28 | WP JD-1445 | HONDA CD 125 T |
| 29 | 122-9069 | HONDA CB 125 T |
| 30 | අංක රහිත | KAWASAKI TRAIL |
| 31 | අංක රහිත | TOYOSTAR 90 |
| 32 | GW 9173 | LONCIN CG 125 |
| 33 | WP XX 8751 | BAJAJ PULSAR (රිය අනතුරට පත්) |
| 34 | 226-4355 ලියාපදිංචි කළ හැකි | TOYOTA ලොරි රථය |
| 35 | WP WV-9927 | BAJAJ DISCOVER 100 |

පහතින් දැක්වෙන ත්‍රීරෝද රථ හා යතුරු පැදි සඳහා මෝටර් රථ පරීක්ෂකගේ තක්සේරු වාර්තා ලැබීමට නියමිත බැවින්, එම වාර්තා ලැබීමට යටත්ව ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

| අනු. අංකය | නඩු අංකය | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|---|
| 36 | AR-1361/20 | WP-AAK 4130 | ත්‍රී රෝද රථය |
| 37 | AR-125/21 | අංකය නැත | යතුරු පැදිය |
| 38 | AR-211/21 | 153-2116 | යතුරු පැදිය |
| 39 | AR-879/21 | WP-BGV 8656 | DIO යතුරු පැදිය |
| 40 | AR-2039/21 | WP-UP 0845 | යතුරු පැදිය |

| අනු. අංකය | නඩු අංකය | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|---|
| 41 | AR-2042/21 | WP-H 2353 | TW යතුරු පැදිය |
| 42 | AR-2122/21 | WP-TG 5014 | යතුරු පැදිය |
| 43 | AR-2123/21 | WP-VB 1072 | DISCOVERY යතුරු පැදිය |
| 44 | AR-2471/21 | NW-MB 9277 | DISCOVERY යතුරු පැදිය |
| 45 | AR-2466/21 | WP-GO 1752 | BAJAJ යතුරු පැදිය |
| 46 | 60298 | අංකය නැත | යතුරු පැදිය |

අංක රහිත නඩු භාණ්ඩ

| අනු. අංකය | විස්තරය |
|---|---|
| 47 | රතු පාට ගෑස් සිලින්ඩර් 02 |
| 48 | කහපාට ලාෆ් වර්ගයේ සිලින්ඩර් 04 |
| 49 | අබලන් වූ ගෑස් ලිප් 03 |
| 50 | හෙල්මට් 16 |
| 51 | මිට්ෂු වර්ගයේ ෆෑන් 01 |
| 52 | බිත්තියේ සවි කරන ෆෑන් 02 |
| 53 | රෙදි රෝල් 04 |
| 54 | සැම්සුන් සෙටප් 01 |
| 55 | කාර් කැසට් 01 |
| 56 | පිලිප්ස් වර්ගයේ අවන් 01 |
| 57 | ඇස්බැස්ටස් ෂීට් ප්‍රමාණයක් |
| 58 | ජිනසේන වතුර මෝටර් 01 |
| 59 | වතුරේ ගිල්වන වතුර මෝටර් 01 |
| 60 | Flash වතුර මෝටර් 01 |
| 61 | Kenwood සෙට් එක සහ බෆල් 01 |
| 62 | එක්ස්ෂයිඩ් වර්ගයේ බැටරි 01 |
| 63 | සින්ගර් ඩිවිඩී යන්ත්‍ර 01 |
| 64 | දිරාපත් වූ පාපැදි 05 |
| 65 | ඇන්ටනා වයර් රෝල් 09 |
| 66 | සාස් පාන් දෙකක් සහ මුට්ටි 01 |
| 67 | කම්පියුටර් CPU 01 ප්ලාස්ටික් පුටු 08 |
| 68 | බෆල් 01 |

| අනු. අංකය | විස්තරය |
|---|---|
| 69 | ඇලුමිනියම් කළ 02 |
| 70 | පිත්තල කුකුළා පහන් 01 |
| 71 | වේවැල්වලින් සාදන ලද කොට්යා |
| 72 | JACK 02 |
| 73 | ටෙඩිබෙයා 01 |
| 74 | අඩි 18 දිග අගල් 04 බට එකයි |
| 75 | HP මොනිටර් 01 |
| 76 | KPC මොනිටර් 01 |
| 77 | LCD මොනිටර් 01 |
| 78 | සෙන්ට්‍රික් වතුර මෝටර් 01 |
| 79 | දූලින්ඩා වර්ගයේ 500l වතුර ටැංකි 01 |
| 80 | ආර්පිකෝ වර්ගයේ 500l වතුර ටැංකි 01 |
| 81 | පැනසොනික් වර්ගයේ බැටරි 01 |
| 82 | ඩේජනයිට් වර්ගයේ බැටරි 01 |
| 83 | වර්ගය හඳුනාගත නොහැකි බැටරි 01 |
| 84 | සිංගර් මහන මැෂින් 02 |
| 85 | ස්ටාර් නැෂනල් වර්ගයේ කොටස් නොමැති ගෑස් ලිප් 01 |
| 86 | බෆල් 02 |
| 87 | ඇම්ප් 01 (Good Gold ) |
| 88 | යකඩ ඉනි 04 |
| 89 | වර්ගය හඳුනාගත නොහැකි වතුර මෝටර් 01 |
| 90 | එඩෝරෝ වතුර මෝටර් 01 |
| 91 | ඩෙල්ටි වතුර මෝටර් 01 |
| 92 | සොලෙක්ස් වතුර මෝටර් 01 |
| 93 | මැෂින් මෝටර් 01 |
| 94 | සුදු යකඩ වතුර ෆිල්ටර් 01 |
| 95 | ඇලුමිනියම් ප්ලේට් 02 |
| 96 | අකායි වර්ගයේ ඩෙක් 01 |
| 97 | සවල් 07 |
| 98 | කුළු ගෙඩි 01 |
| 99 | තුන්කටු 02 |
| 100 | වට 03 ලිප් 02 |
| 101 | වට 02 ලිප් 02 |

නඩු අංක සහිත නඩු භාණ්ඩ

| අනු. අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 102 | 21992 | ආර්පිකෝ වර්ගයේ 500l වතුර ටැංකි එකයි |
| 103 | බී/171/13 | 2000l වතුර ටැංකි එකයි |
| 104 | 99799 | ලිට්රෝ වර්ගයේ ගෑස් සිලින්ඩරය |
| 105 | බී/587/19 | කළු පාට හෙල්මට් එකයි |
| 106 | බී/1706/19 | කළු පාට සම්පූර්ණ මුහුණ ආවරණ හෙල්මට් එකයි |
| 107 | බී/1170/19 | රතු පාට හෙල්මට් එකයි |
| 108 | බී/2095/10 | නැෂනල් වර්ගයේ අවන් එකයි |
| 109 | බී/319/19 | පැනසොනික් වර්ගයේ බැටරි එකයි |
| 110 | බී/408/19 | VANS නම් කර ඇති බෑගයක් |
| 111 | බී/2141/12 | වතුර බට එකයි |
| 112 | බී/1158/10 | කුඩා වතුර මෝටර් එකයි |
| 113 | ඒ.ආර්/724/18 | Singer වතුර මෝටර් එකයි |
| 114 | බී/2216/13 | Singer වතුර මෝටර් එකයි |
| 115 | බී/2266/10 | වතුර මෝටර් එකයි |
| 116 | බී/1741/16 | වතුර මෝටර් එකයි |
| 117 | 27836 | තණකොළ කපන මැෂින් 01 |
| 118 | බී/1736/10 | තණකොළ කපන මැෂින් 01 |
| 119 | බී/2050/15 | වඩු කාර්මික මැෂින් 01 |
| 120 | බී/698/15 | ත්‍රීවිල් ටයර් 01 |
| 121 | බී/699/15 | ත්‍රීවිල් ටයර් 02 |
| 122 | බී/2595/11 | මේස විදුලි ලාම්පුව |
| 123 | බී/1016/09 | විදුලි පන්දම |
| 124 | බී/1660/13 | යමහා ඇම්ප් එකයි |
| 125 | බී/1104/09 | වඩු කාර්මික මැෂින් එකයි |
| 126 | බී/840/13 | ආපිටෙක් වතුර මෝටර් එකයි |
| 127 | බී/252/19 | උදළු එකයි |
| 128 | බී/2141/17 | යකඩ ඉනි 01 |
| 129 | බී/402/14 | ශබ්ද විකාශන යන්ත්‍ර 02 |
| 130 | බී/1242/08 | ප්ලාස්ටික් පුටු 02 |
| 131 | බී/1240/18 | ඩෙල් සීපියූ යන්ත්‍ර 01<br>සැම්සුන් සීපියූ යන්ත්‍ර 01 |
| 132 | බී/2141/17 | උදළු එකයි |
| 133 | බී/905/17 | කාර්මික උපකරන දමන ප්ලාස්ටික් පෙට්ටි 01 |
| 134 | බී/994/18 | හිරමන එකයි |
| 135 | බී/1672/07 | වතුර මෝටර් එකයි |
| 136 | බී/886/09 | එඩෝරෝ වතුර මෝටර් එකයි |
| 137 | බී/443/19 | යකඩ ඉනි 01<br>කුළු ගෙඩි 01 |
| 138 | බී/2260/17 | උදළු 01 |
| 139 | බී/2745/17 | කුළු ගෙඩි 03 |
| 140 | බී/1956/09 | වතුරේ ගිල්වන මෝටර් 01 |
| 141 | 95972 | කුළු ගෙඩි 01 |
| 142 | බී/252/19 | යකඩ ඉනි 02 |
| 143 | 66589 | ජේෂර් කුකර් 01 |
| 144 | 95672 | යකඩ ඉනි 01 |
| 145 | බී/1415/13 | ලුමාලා පාපැදිය |
| 146 | ඒආර්/112/13 | රැලේ පාපැදිය |
| 147 | බී/1900/15 | පාපැදිය |
| 148 | බී/500/13 | පාපැදිය |
| 149 | බී/1916/13 | පාපැදිය |
| 150 | බී/2130/15 | පාපැදිය |

07-44

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලය අවලංගු කිරීම

ඇමරිකා එක්සත් ජනපදය අයෝවා 52241 කොරල්විල්, 14 වන වීදිය, අංක 2102 හි පදිංචි ඩවුන්ඩ මුදියන්සේලාගේ උපේන්ද්‍ර සුමනසිරි (ජා. හැ. අංකය 731522618V) යන අය විසින් හෝමාගම, හබරකඩ, සමුපකාර මාවත, අංක 371/9 හි පදිංචි මැද්දගේ දොන් නිමල් කපුමුල්ල (ජා. හැ. අංකය 711880992V) යන අය මාගේ ඇටර්නි බලකරු ලෙස පත් කරමින් 2020.08.20 වැනි දින දරන විදේශීය ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව සියලු දෙනාටම මෙයින් දැනුම් දෙමි.

මින් ඉදිරියට එකී ඇටර්නි බලකරු විසින් ඉහත කී ඇටර්නි බලපත්‍රය යටතේ කරනු ලබන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මා වගකීම් නොදරන බව සියලු දෙනාටම මෙයින් දැනුම් දෙමි.

ඩවුන්ඩ මුදියන්සේලාගේ උපේන්ද්‍ර සුමනසිරි

07 - 03

## ඇටර්නි බලය අවලංගු කිරීම

එක්සත් රාජධානිය ඩබ්. වී. 24.7 එච්. ඊ. වොට්ෆර්ඩ් වෙස්ට් ෆීල්ඩ් ඇවනියු අංක 76 හි පදිංචි ගුණසේකර මුදියන්සේලාගේ චන්ද්‍රන ගුණසේකර (ජා. හැ. අංකය 519674669V) යන අය විසින් මාලබේ, ලේක් පාර, සෙල්නා රෙසිඩන්සීස්, අංක 289/5/ඒ/34 හි පදිංචි අමා කුමාරි ගුණසේකර (ජා. හැ. අංකය 197053810042) යන අය මාගේ ඇටර්නි බලකරු ලෙස පත්කරමින් 2020.11.18 වැනි දින දරන විදේශීය ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව සියලුදෙනාටම මෙයින් දැනුම් දෙමි.

මින් ඉදිරියට එකී ඇටර්නි බලකරු විසින් ඉහත කී ඇටර්නි බලපත්‍රය යටතේ කරනු ලබන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මා වගකීම් නොදරන බව සියලු දෙනාටම මෙයින් දැනුම් දෙමි.

ගුණසේකර මුදියන්සේලාගේ චන්ද්‍රන ගුණසේකර

07 - 04

## ඇටර්නි බලය අවලංගු කිරීම

නාවලපිටිය, මල්ලන්ද, දොරුවාදෙණිය පාර, අක්කර 05 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 840254232 V හිමි චාමර කෞශල්‍ය වීරරත්න වන මා, බෙන්තොට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. සනත් ඩී. ගුණතිලක මහතා විසින් 2019.07.05 වැනි දින සහතික කරන ලද අංක 3580 දරන ඇටර්නි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරු ලෙස බෙන්තොට, පිටාරඹ ශ්‍රී ධර්ම විජයාරාම මාවත, අංක 150 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 198783910019 හිමි නාකන්දලාගේ දෝන සිතාරා උදයංගනී යන අය පත්කිරීම 2022.05.12 වැනි දින සිට නීත්‍යානුකූලව අවලංගු කරමින් බල රහිත කරන බව මෙයින් ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් දැනගැනීම පිණිස නිවේදනය කරනු ලැබේ.

චාමර කෞශල්‍ය වීරරත්න

07 - 08

## ඇටර්නි බලය අවලංගු කිරීම

මාකොළ, මාකොළ උතුර, තැඹිලිගස්මුල්ල පාරේ, අංක 264/29 ස්ථානයේ පදිංචි මාකවිටගේ මේරි කැලිස්ටා පෙරේරා වන මා විසින්, 2014.09.30 දින ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේදී ලියා සහතික කරන ලද හා 2014.10.30 දින ශ්‍රී ලංකාවේ, බත්තරමුල්ල, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ, මාකොළ, මාකොළ උතුර, අංක 06 ස්ථානයේ පදිංචි මාකවිටගේ ජෙරාඩ් පෙරේරා (ජා.හැ.අංක 541730940V) යන අය වෙත ප්‍රදානය කරන ලද ඇටර්නි බලපත්‍රය, මෙම දැන්වීම 2022.04.01 දින සිට ක්‍රියාත්මක පරිදි, අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව මහජනතාව වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

එසේම, ඉහත සඳහන් ඇටර්නිලාභියා වන මාකවිටගේ ජෙරාඩ් පෙරේරා යන අය විසින්, ඉහත ඇටර්නි බලපත්‍රය යටතේ මාගේ නමින් හෝ මා වෙනුවෙන් හෝ මින් මතුවට සිදුකරනු ලබන කිසිදු කාර්යයකට හෝ ගනුදෙනුවකට මාගේ කිසිදු වගකීමක් නොමැති බවද දන්වා සිටිමි.

එම්.එම්.කැලිස්ටා පෙරේරා

07 - 09

## ඇටර්නි බලය අවලංගු කිරීම

මාකොළ, මාකොළ උතුර, තැඹිලිගස්මුල්ල පාරේ, අංක 264/29 පදිංචි ෆ්‍රැන්සිස්කු හේවගේ රොහාන් නිමල් වන මා විසින් 2011.09.28 දින ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ලියා සහතික කරන ලද හා 2011.11.08 දින ශ්‍රී ලංකාවේ, බත්තරමුල්ල, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ මාකොළ, මාකොළ උතුර, අංක 06 ස්ථානයේ පදිංචි මාකවිටගේ ජෙරාඩ් පෙරේරා (ජා.හැ.අංක 541730940V) යන අය වෙත ප්‍රදානය කරන ලද ඇටර්නි බලපත්‍රය, මෙම දැන්වීම 2022.04.01 දින සිට ක්‍රියාත්මක පරිදි, අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව මහජනතාව වෙත දන්වා සිටිනු ලැබේ.

එසේම, ඉහත සඳහන් ඇටර්නිලාභියා වන මාකවිටගේ ජෙරාඩ් පෙරේරා යන අය විසින්, ඉහත ඇටර්නි බලපත්‍රය යටතේ මාගේ නමින් හෝ මා වෙනුවෙන් හෝ මින් මතුවට සිදුකරනු ලබන කිසිදු කාර්යයකට හෝ ගනුදෙනුවකට මාගේ කිසිදු වගකීමක් නොමැති බවද දන්වා සිටිමි.

එෆ්.එච්. රොහාන් නිමල්

07 - 10

## ඇටර්නි බලය අවලංගු කිරීම

මීගමුව, උතුරු කදිරාන, කොන්ඩෝර් ප්‍රින්ටර්ස් හි සන්තාන දේවගේ ජයනි අමාලි ද සිල්වා (ජා.හැ. අංකය : 865071124V) වන මා විසින් මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ෂර්ලි අමරසේකර වර්ෂ 2015.05.26 වන දින ලියා සහතික කළ අංක 2853 දරන ඇටර්නි බලය මගින් මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු ලෙස මීගමුව, උතුරු කදිරාන, කොන්ඩෝර් ප්‍රින්ටර්ස් හි තේනාහන්දි පද්මිණී ශ්‍රියාලතා ද සිල්වා පත් කළ බවද, එකී ඇටර්නි බලය '2020.07.01' දින සිට අවලංගු සහ බලරහිත කරන බවද, එය තවදුරටත් වලංගු ලේඛනයක් නොවන බවද ශ්‍රී ලංකා මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

සන්තාන දේවගේ ජයනි අමාලි ද සිල්වා

07 - 11

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. සී. කේ. හෙට්ටිආරච්චි මහතා විසින් ලියා සහතික කරන ලද අංක 121 සහ 2012.10.01 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින් වතුරුගම අංක 184/1, "සිසිර" හි පදිංචිව සිටි දැනට අල් සාද් කොමර්ෂල් සෙන්ටර්, අල් සාද් වීදිය, පී. ඕ. 2197, දෝහා කටාර් හි පදිංචි මූතා මෙරෙඤ්ඤ ඉරේෂාන් උදයංග ප්‍රේමසාර වන මා විසින් වතුරුගම, අංක 184/1, "සිසිර" පදිංචි මූතා මෙරෙඤ්ඤ ප්‍රේමසාර යන අය වෙත පවරා දෙන ලද ඇටර්නි බලතල මෙයින් සම්පූර්ණයෙන් අවලංගු කරන ලද බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

තවද එකී මූතා මෙරෙඤ්ඤ ප්‍රේමසාර විසින් ඉහත කී ඇටර්නි බලපත්‍රය මත සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ගනුදෙණුවකට මෙයින් පසු මා විසින් කිසිදු වගකීමක් නොදරන බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

මූතා මෙරෙඤ්ඤ ඉරේෂාන් උදයංග ප්‍රේමසාර

07 - 17

## ඇටර්නි බලය අවලංගු කිරීම

වතුරුගම, මිරිස්වත්ත පාර, ගලකැල්ල වත්ත හි පදිංචි චමත් රෝහණ බංඩාර මාපා (ජා. හැ. අංක 603511190V) වන මම ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් R. M. A.W. රාජකරුණා මහතා විසින් වර්ෂ 1987.10.13 වැනි දින ලියා සහතික කරන ලද අංක 4562 දරන ඇටර්නි බලපත්‍රය මගින් වතුරුගම, මිරිස්වත්ත පාර දරන ස්ථානයේ පදිංචි ජගත් ආනන්ද බංඩාර මාපා (ජා. හැ. අංක 582436193V) වෙත පවරන ලද බලය මෙම දැන්වීමේ දින සිට බලපැවැත්වෙන පරිදි මින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ මහජනතාව වෙත මින් දන්වා සිටිමි.

චමත් රෝහණ බංඩාර මාපා

07 - 18

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කටුගස්තොට, ගොහාගොඩ, අංක 339/1 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 880961721V හිමි කුරබේ ගෙදර ලක්ෂ්මන් සාලිය සම්පත් වන මා විසින් නෙටොල්පිටිය, වැලිආර, අංක 228 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 905033417V දරන කොග්ගල හේවාගේ දිවන්කා හර්ෂනී වෙත දෙන ලද අගුණකොළපැලැස්ස, හැඩකැටිය පදිංචි රදීෂා දේශානි මුණසිංහ මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 13 හා වර්ෂ 2019 ක් වූ ජූලි මස 01 වැනි දිනැති ඇටර්නි බලපත්‍රය අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දන්වා සිටිනු ලැබේ.

මා සඳහා හෝ මා වෙනුවෙන් ඉහත කී කොග්ගල හේවාගේ දිවන්කා හර්ෂණී යන අය විසින් සිදුකරනු ලබන්නා වූ කිසිම දෙයක් සම්බන්ධයෙන් වගකීම මා විසින් භාරගනු නොලැබේ.

කුරබේ ගෙදර ලක්ෂ්මන් සාලිය සම්පත්

07 - 20

## ඇටර්නි බලය අවලංගු කිරීම

කොළඹ 14, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, සිරිමුතු උයන, අංක C/F9/U 10 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 525104753V හිමි ස්වර්ණා වීරසිංහ වන මා වර්ෂ 2016ක් වූ මාර්තු මස 02 වැනි දින එම්. එච්. එම්. ඒ. රස්වි නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද අංක 2791 දරන ඇටර්නි බලපත්‍රය මගින් කොළඹ 14, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, සිරිමුතු උයන, අංක C/F9/U 10 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 792104526V හිමි දොම්පෙ ආරච්චිගේ අජන්ත යන අයට ලබා දෙන ලද සියලුම බලතල 2022.05.30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරා අහෝසි කරන බව සියලුම දෙනා වෙත මෙයින් දැනුම් දෙමි.

මින් මතුවට ඉහත කී ඇටර්නි බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසිදු වගකීමක් මා විසින් නොදරන බවටද මෙයින් දැනුම් දෙමි.

ස්වර්ණා වීරසිංහ

07 - 43

## ඇටර්නි බලය අවලංගු කිරීමයි

මිනුවන්ගොඩ, මැදමුල්ල, එක්සයිස් වත්ත, අංක 180/7E හි පදිංචි රේවත සෙනරත් බණ්ඩාර රත්නායක (ජා. හැ. අ. 660421114V) වන මා ඇටර්නි බලකරු වශයෙන් අංක 9, විනෙරි වේ, හෙන්ඩර්සන්, ඕක්ලන්ඩ්, 0612 නවසීලන්තයේ පදිංචි අබ්දුල් අසීස් මොහොමඩ් හම්සා ( විදේශ ගමන් බලපත්‍ර අංක N 3396681) යන ඇටර්නි අධිපති විසින් නම් කොට පත්කරන ලද ශ්‍රී ලංකාවේ රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ වර්ෂ 2015.09.17 දින ලිඛිත බලධාරිකම් හා ඇටර්නි බලපත්‍ර ලේඛනයේ 51 බාණ්ඩයේ 67 පත් ඉරුවේ 25630 දින පොත් අංක යටතේ ලියා පදිංචි විශේෂ ඇටර්නි බලකරය ඉහත කී ඇටර්නි බලකරු වන මා මෙමගින් අවලංගු කරන අතර, එකී ලේඛනය වර්ෂ 2022 ක්වූ ජුනි මස 22 වැනි දින සිට බලපැවැත්මක් නොමැති බවට ශ්‍රී ලංකා ජනරජයට සහ පොදු මහජනතාවට මෙමගින් හෙළිදරව් කර සිටිමි.

රේවත සෙනරත් බණ්ඩාර රත්නායක

07 - 12

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (බලංගොඩ ශාඛාව) (බලංගොඩ ශාඛාව) මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

1990 අංක 4 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, මැද කෝරළේ, හෙළඋඩ පත්තුවේ, බලංගොඩ නාගරික සහා සීමා ඇතුළත රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ G.N.Div. 256A බලංගොඩ නගරයේ ග්‍රාම නිළධාරි කොට්ඨාශය ඇතුළත බලංගොඩ නගරයේ පිහිටි ''කරව්කැටියේ එස්ටේට්'' (කොටස) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, ඒ. රත්නම් විසින් 2003.01.28 වැනි දින පිළියෙල කරන ලද අංක 90/03 දරණ පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස

ප්‍රමාණය රූඩ් එකයි පර්චස් තිස්තුනයි දශම නවයයි බිංදුව (අ: 0 - රූ: 1 - පර්: 33.90) විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වේ.

එකී ඉඩමට වෙන්කරන ලද මාර්ග අයිතිය සමග වේ.

ගෝවින්නගේ අතුල පෙරේරා ගුණසේකර සහ පොල්වත්තේ රත්තරන් හාමිලාගේ අයේෂා මධුවන්ති ණයකරුවන් හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත උපලේඛණයේ සඳහන් දේපල

**වර්ෂ 2022 ක් වූ ජූලි මස 19 වැනි දින ප.ව 01.30ට** ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2021.05.07 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද 2021.05.07 වන දින දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරි පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම :-*

බලංගොඩ නගරයේ ප්‍රධාන ඔරලෝසු කණුව හංදියේ සිට බාන්ස් රත්වත්ත මාවත ඔස්සේ කරව්කැටිය පාර දක්වා මීටර් 300ක පමණ දුරක් ගමන් කර අනතුරුව වමට හැරී වම් අත පැත්තේ ප්‍රවේශ පාර දක්වා මීටර් 50 ක් පමණ කරව්කැටිය පාර ඔස්සේ ගමන් කර අනතුරුව වමට හැරී විෂයගත දේපල දක්වා මීටර් 100 ක පමණ දුරක් මෝටර් රථ ප්‍රවේශවිය හැකි තාර පාර ඔස්සේ ගමන් කළ විට දේපල පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.(චාමර පාරට යාබදව)

ගෙවීමේ ක්‍රමය :

විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%) (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 3,500/- (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,500/- (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම් (07) ගැණුම්කරු විසින් අකාලික වටිනාකම බද්ද (VAT) ගෙවිය යුතුයි (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ බලංගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතුය.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් 011-2445393
ඊමේල් senaservice84@gmail.com

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.
අංක 195, රත්නපුර පාර,
බලංගොඩ.
දුරකථන 045-2286719
ෆැක්ස් 045-2286700

07-16

---

**ලංකා බැංකුව**

වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංක - 82196394, 70768201, 76987064, 83004142

කැප්පෙටිපොල, හපුතලේ පාර, අංක 48 හි රත්නායක මුදියන්සේලාගේ අතුල බණ්ඩාර මහතාට අයත් උකස් කරන ලද දේපල විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019 ජුනි

14 දිනැති අංක 2128 දරන ගැසට් පත්‍රයේ හා 2019 ජුනි 03 වැනි බ්‍රහස්පතින්දා දින "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්", යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අය කර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර එකී ස්ථානයේදීම **2022.07.19 පෙ.ව. 10.30 සහ පෙ.ව. 11.30** ට කොළොන්නාව, විහාර මාවත, අංක 182/3, (50/3) හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

## උපලේඛනය

1. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, අංක 50 පලුගම ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ උඩුකිඳ උඩපළාත කෝරළේ, පලුගම ග්‍රාමයේ පිහිටි "පුපල වත්ත" නැමැති හා එනමින් ප්‍රසිද්ධ සීමා විස්තර කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් සාදන ලද 2007.04.20 දිනැති අංක BD/6243 දරන පිඹුරෙහි ලොට් අංක 01 ලෙස නිරූපණය කර ඇති එකී බෙදූ ඉඩම් කැබැල්ල එකී පිඹුරට අනුව උතුරට : කන්දෙඇල හා ප්‍රධාන පාරද, නැගෙනහිරට : එස්. පී. රත්නායක විසින් සාදන ලද 1990.07.17 දිනැති අංක 106 දරන පිඹුරෙහි ලොට් අංක 03 ද, දකුණට : කේ. එන්. එම්. චන්ද්‍රසේන උරුමකම් කියන ඉඩමද, බස්නාහිරට : එස්. පී. රත්නායක විසින් සාදන ලද 1990.07.17 දිනැති අංක 106 පිඹුරෙහි ලොට් අංක 01 ද මායිම්ව රූඩ් එකයි පර්චස් හයයි දශම හයක (රූ.1 පර්. 6.6) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ සමඟ වේ.

   එකී ලොට් 01 පහත සඳහන් ඉඩමෙහි නැවත මැනීමකි.

   ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, අංක 50 පලුගම ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ උඩුකිඳ උඩපළාත කෝරලේ පලුගම ග්‍රාමයේ පිහිටි "පුපල වත්ත" නැමැති හා එනමින් ප්‍රසිද්ධ සීමා විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් බලයලත් මිනින්දෝරු එස්. පී. රත්නායක විසින් සාදන ලද 1990.07.17 දිනැති අංක 106 දරන පිඹුරෙහි ලොට් 02 එකී පිඹුරට අනුව උතුරට : කන්දෙ ඇල හා ප්‍රධාන පාරද, නැගෙනහිරට : ලොට් අංක 03 හා කේ. එන්. එම්. ජයසේකර උරුමකම් කියන ඉඩමද, දකුණට : කේ. එන්. එම්. චන්ද්‍රසේන උරුමකම් කියන ඉඩමද බස්නාහිරට : ලොට් අංක 01 ද මායිම්ව රූඩ් එකයි පර්චස් හයයි දශම හයක (රූ.1 පර්. 6.6) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ සමඟ වේ. මෙය බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N45/80 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකිඳ උඩපළාත කෝරළේ, වැලිමඩ ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාවේ පාදිනාවෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හරක්ගමකන්ද ග්‍රාමයේ පිහිටි "පාදිනාවෙල අස්වැද්දුම" නැමැති ඉඩමට එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු එච්. එම්. සමරනායක විසින් සාදන ලද 1999.06.16 දිනැති අංක 2184 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 01 උතුරට : ලොට් අංක 02 ද, නැගෙනහිරට : ලොට් අංක 02 සහ මහා මාර්ගය (නුවරඑළිය-වැලිමඩ ප්‍රධාන පාර) සහ කුසුමාවතී උරුමකම් කියන පාර ද බස්නාහිරට : ඇලද මායිම්ව එකී අංක 2184 දරන පිඹුරට අනුව පර්චස් තිස්හයයි දශම තුනක (පර්.36.3) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N16/69 හි ලියාපදිංචි කර ඇත.

   ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකිඳ උඩපළාත කෝරළේ, වැලිමඩ ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාවේ පාදිනාවෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හරක්ගමකන්ද ග්‍රාමයේ පිහිටි පාදිනාවෙල අස්වැද්දුම නැමැති ඉඩමට එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු එච්. එම්. සමරනායක විසින් සාදන ලද 1999.06.16 දිනැති අංක 2184 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 02 උතුරට : ඇලද, නැගෙනහිරට : තිසාලූහාමිට අයිති ඉඩම වෙන් කරන අඩි පාරද, දකුණට : මහා මාර්ගය (නුවරඑළිය-වැලිමඩ ප්‍රධාන මාර්ගය) සහ ලොට් අංක 01 ද, බස්නාහිරට : ලොට් අංක 1 සහ ඇලද මායිම්ව එකී අංක 2184 දරන පිඹුරට අනුව රූඩ් දෙකක (රූ.2) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හි N16/119 හි ලියාපදිංචි කර ඇත.

   මේ සමග මෙයට බලයලත් මිනින්දෝරු එස්. එච්. එම්. සමරනායක විසින් සාදන ලද 1999.06.16 දිනැති අංක 2184 දරන එකී පිඹුරෙහි නිරූපිත ප්‍රවේශ මාර්ගය මතින් හා ඒ දිගට මාර්ග අයිතියද ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. එස්. ජීවානන්ද මහතා,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
වැලිමඩ ශාඛාව.

07-28

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ඩී. ඩී. එම්. එච්. දෙව්පුර
ගිණුම් අංක : 0167 5000 1045

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ

ලැබී ඇති බලතල ප්‍රකාර 2017.11.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි අනූ තුන් ලක්ෂ දහ තුන් දහස් දහ හතක (රු. 19,313,017/-) මුදල ද, 2017 ඔක්තෝබර් 12 දින සිට අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි හැත්තෑ නම ලක්ෂ පනස් දහසක (රු. 17,950,000/-) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2018.07.20 දින රජයේ *ගැසට් පත්‍රයේ* 2018.07.13 දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2022.08.05 දින පෙ. ව. 11.30** ට කොළඹ 2, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක. 110, සම්පත් බැංකුව පීඑල්සී පරිශ්‍රයන් හිදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්යේ, දිඹුලාගල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ එගොඩ පත්තුවේ දිඹුලාගල ප්‍රාදේශීය සභා සීමාවන, තුළ දම්මනේවැව අංක. 255 දරණ ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ දම්මනේවැව ග්‍රාමයේ පිහිටි ''දම්මනේවැවයාය'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එම්. චන්ද්‍රරත්න යන අය විසින් සාදන ලද 2014 දෙසැම්බර් 08 දාතම හා අංක. 2933 දරණ පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : FCP Po. 409 හි ලොට් 325 සහ 245 (පාර) නැගෙනහිරට : FCP Po. 409 හි ලොට් 245 (පාර) සහ 321 දකුණට : FCP Po. 409 හි ලොට් 321 සහ 323 සහ බස්නාහිරට : FCP Po.409 හි ලොට් 323 සහ 225 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් හයයි දශම හතක් (අ.0, රූ.1 පර්.36.7) හෝ හෙක්ටයාර 0.194 ක් විශාල ඉඩම් කොටස සමඟ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර සහ එහි පිහිටි සැම සියලු දේ සමග විශාල ඉඩම් කොටස සමග එකී අංක. 2933 දරණ පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්කර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, දිඹුලාගල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දම්මනේවැව අංක. 255 දරන ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ දම්මනේවැව ග්‍රාමයේ පිහිටි ''දම්මනේවැවයාය'' යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සහතික කරන ලද FCP Po. 409 හි නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 320 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 325 සහ 245 (පාර) නැගෙනහිරට : ලොට් 245 (පාර) සහ 321 දකුණට : ලොට් 321 සහ 323 සහ බස්නාහිරට : ලොට් 323 සහ 325 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම එකයි නවයයි හතරක් (හෙක්ටයාර 0.194) ක් විශාල ඉඩම් කොටස සමඟ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර සහ එහි පිහිටි සැම සියලු දේ සමග විශාල ඉඩම් කොටස සමග එකී අංක. FCP Po. 409 ට අනුව වෙළුම/පත්‍රිරුව LDO/J/18/115 යටතේ පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

උකස් බැඳුම්කර අංක. 381 සහ 851 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

2. උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ නුවරවැව දමනේවැව සංදීප හාල් මෝල අංක. 322 යන පරිශ්‍රයන් හි තබනු ලබන හෝ වෙනත් ඕනෑම ස්ථානයකට හෝ ස්ථානවලට ගෙනයනු ලබන සහ ඒවායේ තබනු ලබන ගබඩා කොට තබනු ලබන හෝ ස්ථාපිත කොට තබනු ලබන මෙහි මැනවින් විස්තර කොට ඇති සියළුම හා එක් එක් චංචල යන්ත්‍රාගාර යන්ත්‍රසූත්‍ර සහ උපකරණ.

| *යන්ත්‍රයේ නම* | *ඒකක ගණන* | *වටිනාකම අනුව වෙළඳපල වටිනාකම (රු.)* |
|---|---|---|
| Color Sorter | 01 | 4,500,000.00 |
| Drier | 01 | 2,500,000,00 |
| Rubber Roll Husker | 01 | 425,000.00 |
| Polisher | 02 | 120,000.00 |
| Rice Grader | 01 | 450,000.00 |
| Stoner | 01 | 250,000.00 |
| Stock Tank - I | 01 | 225,000.00 |
| Stock Tank - II | 01 | 175,000.00 |
| ID Fan | 01 | 100,000.00 |
| 09 Double Elevator‘ | | 54,000.00 |
| Generator | 01 | 1,400,000.00 |
| **TOTAL VALUE** | | **10,199,000.00** |

එකී පරිශ්‍රයන් වෙතට ගෙනෙනු ලබන හා ස්ථාපිත කරනු ලබන චංචල යන්ත්‍රසූත්‍ර සහ එකී යන්ත්‍රසූත්‍ර උපකරණ හෝ ඒවායින් කොටසක් හෝ ඕනෑම උපකරණ කොටසක් හෝ වෙනුවට කලින් කලට ගනු ලැබිය හැකි චංචල යන්ත්‍රසූත්‍ර.

උකස් බැඳුම්කර අංක. SB/167/2017/MAC/001 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

07-30

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි.

බී. ජී. රත්නසේන
ගිණුම් අංක 0225 5000 0354

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.11.26 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පන්කෝටි පනස් එක් දහස් තුන්සිය හැත්තෑ නමයයි ශත හතරක (රු. 50,051,379.04) මුදලද, 2020 ඔක්තෝබර් මස 26 දින සිට අංක 2811 දරන උකස් බැඳුම්කරය මත අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැත්තෑ තුන් ලක්ෂ හතලිස් හය දහස් නමසිය හැත්තෑ පහක (රු. 7,346,975) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) හා තවත් රුපියල් තුන් කෝටි පනස් තුන් ලක්ෂ අසූ තුන් දහසක (රු. 35,383,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක (16%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2022.02.11 දින රජයේ ගැසට් පත්‍රයේ 2022.01.31 දින ''දිවයින'', සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි **2022.08.05 දින පෙ. ව. 11.30** ට පිහිටි ස්ථානයේදී, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළේ මැද පත්තු ගොඩකවෙල ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ගොඩකවෙල ග්‍රාම නිළධාරී කොට්ඨාසය තුළ ගොඩකවෙල ග්‍රාමයේ පිහිටි ''තිබ්බොටුහේනේ වත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඊ. එම්. අමරසේකර යන අය විසින් සාදන ලද 2017 අගෝස්තු මස 18 (2017 අගෝස්තු මස 07 වැනි දින මනින ලද) දතම හා අංක 228 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇත ඉඩම් කොටසට මායිම් : උතුරට : ප්‍රධාන පාර, නැගෙනහිරට : අංක 3410 දරන පිඹුරේ ලොට් 2, දකුණට : දෙඹවෙල ඇළ සහ අංක 4466 දරන පිඹුරේ ලොට් 12 සහ 10, බස්නාහිරට : අංක 4466 දරන පිඹුරේ ලොට් 12 සහ 7 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතරක් (රූ. 1, පර්. 4) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 228 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A 32/122 යටතේ ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

07-31

---

**සම්පත් බැංකුව පීඑලසී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

නිරුක කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් සප්ලයර්ස්
ගිණුම් අංක : 0030 1000 2892

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.01.31 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හය කෝටි අනූනම ලක්ෂ අසූතුන් දහස් පන්සිය නමයයි ශත අනූවක (රු. 69,983,509.90) මුදලද, 2019 ජනවාරි මස 09 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර කෝටි හැත්තෑ හතර ලක්ෂයක (රු. 47,400,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) හා තවත් රුපියල් හැට නම ලක්ෂයක (රු. 6,900,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) හා තවත් රුපියල් දහ නම ලක්ෂයක (රු. 1,900,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) හා තවත් රුපියල් එක් කෝටියක (රු. 10,000,000) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + + Four Decimal Five per centum (4.5%) per annum (Floor Rate 16.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනිම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.03.15 දින රජයේ ගැසට් පත්‍රයේ 2019.02.28 දින ''දිවයින'', සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි **2022.07.26 දින පෙ. ව. 11.30** ට පිහිටි ස්ථානයේදී, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරළේ කම්මල් පත්තුවේ නාත්තන්ඩිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මීගහවැව ග්‍රාම

නිලධාරි කොට්ඨාසය තුළ පහළ කටුනේරිය පිහිටි ''පතහේවත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එස්. එස්. ඒ. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2011 ජූලි මස 08 දාතම හා අංක 3477 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : නිමල් ප්‍රනාන්දු සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : ඩබ්ලිව්. කේ. සයිමන් ප්‍රනාන්දු යන අයගේ උරුමක්කාරයින් විසින් හිමිකම් කියනු ඉඩම දකුණට : ඩබ්ලිව් එම්. ආර්. ප්‍රනාන්දු සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : හලාවත - මීගමුව ප්‍රධාන පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් තිහක් (අ.1, පර්.30) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සමග එකී අංක 3477 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී පහළ කටුනේරිය පිහිටි ''පතහේවත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. එච්. ඒ. මෙන්ඩිස් යන අය විසින් සාදන ලද 1989 ඔක්තෝබර් 11 දාතම හා අංක 6099 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : සනීගේ ඉඩම නැගෙනහිරට : ඩබ්ලිව් ආර්. සයිමන් ප්‍රනාන්දු යන අයගේ උරුමක්කාරයින් ගේ ඉඩම දකුණට : ඩබ්ලිව්. ආර්. ප්‍රනාන්දු අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ පිරවුම්හල පරිශ්‍රයන් සහ බස්නාහිරට : හලාවත - මීගමුව ප්‍රධාන පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් තිස් හයක් (අ.1. පර්.36) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සමග එකී අංක 6099 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව J 182/108 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-32

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි.

න්‍යුට්‍රිබල් ට්‍රිලර් (ප්‍රයිවට්) ලිමිටඩ්
(කේ. ඩී. සරෙන්ඩිප් ෆුඩ් ප්‍රොඩක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමග ඒකාබද්ධ කොට ඇති)
ගිණුම් අංක : 0002 1003 6946

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2022.03.31 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එකසිය දහඅට කෝටි හතලිස් ලක්ෂ අනූහත් දහස් තුනයි ශත හතලිස් එකක (රු. 1,184,097,003/41) මුදලද, 2022 මාර්තු මස 04 දින සිට අංක 1455, 3449 සහ 3448 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි හතලිස් නම ලක්ෂ විසිහත් දහස් අටසිය දහ තුනයි ශත තුනක (රු. 14,927,813/03) මුදලක් සඳහා වාර්ෂිකව සියයට අටක් (8%) (වසරක් සඳහා ස්ථාවර) Average Weighted Prime Lending Rate (මාසිකව) + වාර්ෂිකව සියයට දෙකයි දශම පහ බැගින් (2.5%) per annum, හා තවත් රුපියල් අසූ දෙකෝටි හැට ලක්ෂයක (රු. 826,000,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට අටක් (8%) (වසරක් සඳහා ස්ථාවර) Average Weighted Prime Lending Rate (මාසිකව) + වාර්ෂිකව සියයට දෙකයි දශම පහ බැගින් (2.5%) per annum සහ තවත් රුපියල් විසි අට කෝටි හැත්තෑ ලක්ෂයක (රු. 287,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහක් (5%) බැගින් වූ පොළියද, දන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ ගාස්තුද, වෙනත් තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනිම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2022.06.03 දින රජයේ ගැසට් පත්‍රයේ 2022.05.23 දින ''දිවයින'', සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2022.08.12 දින පෙ. ව. 11.30** ට පිහිටි ස්ථානයේදී බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

